මගේ අංකය:ස.සේ.කො./01/iv වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල
කුරුණෑගල.
2024.03.07

ස.සේ.කො. චක්‍රලේඛ අංක 03/2020 (iii)

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරී/කළමනාකරු,

<u>බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සංශෝධනය කිරීම.</u>

ස.සේ.කො.03/2020 චක්‍රලේඛයේ සඳහන් ප්‍රවාහන නිලධාරී තනතුර SL වැටුප් පරිමාණයේ අධීක්ෂණ මට්ටමේ තනතුරක් ලෙස සංශෝධනය කිරීමට හා එම තනතුර සඳහා අනුමත කර ඇති බඳවා ගැනීමේ සුදුසුකම පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට අංක 68/2024/02 හා 2024.02.05 දිනැති කොමිෂන් සභා නියෝගය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

| තනතුරු නාමය | වැටුප් සංකේත අංකය | ශ්‍රේණිය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | |
|---|---|---|---|---|
| | | | බාහිර බඳවා ගැනීම(විවෘත) | අභ්‍යන්තර බඳවා ගැනීම(සීමිත) |
| 45<br>ප්‍රවාහන නිලධාරී | SL | III | අ).අ.පො.ස.(උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂයය ධාරාවකින් විෂයයන් 03කින් එකවර සමත් වීම හා රජයේ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ මාස 06කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත පාඨමාලාවක් සමත් වීම<br><br>සමඟ<br><br>රැකියා ක්ෂේත්‍රයට අදාල තනතුරක වසර 01 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.(අවම වශයෙන් සැහැල්ලු රියදුරු බලපත්‍රයක් හෝ ලබා තිබිය යුතුය) | අ).අ.පො.ස.(උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂයය ධාරාවකින් විෂයයන් 03කින් එකවර සමත් වීම හා රජයේ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ මාස 06කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත පාඨමාලාවක් සමත් වීම<br><br>සමඟ<br><br>OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 02කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.(අවම වශයෙන් සැහැල්ලු රියදුරු බලපත්‍රයකක් හෝ ලබා තිබිය යුතුය)<br><br>ආ). ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (උසස් පෙළ) පාඨමාලාව විෂයයන් 02කට සම්මාන සහිතව සියලු විෂයයන්ගෙන් සමත් වීම හා රජයේ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ මාස 06කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත පාඨමාලාවක් සමත් වීම |

| තනතුරු නාමය | වැටුප් සංකේත අංකය | ශ්‍රේණිය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | |
|---|---|---|---|---|
| | | | බාහිර බඳවාගැනීම්(විවෘත) | අභ්‍යන්තර බඳවාගැනීම්(සීමිත) |
| | | | | සමඟ<br><br>OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම. (අවම වශයෙන් සැහැල්ලු රියදුරු බලපත්‍රයක් හෝ ලබා තිබිය යුතුය) |

02. ප්‍රවාහන නිලධාරි තනතුරේ දැනට සේවයේ නිරත සේවකයින් SL වැටුප් පරිමාණයේ ප්‍රවාහන නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කිරීමේ අන්තර්කාලීන විධි විධාන පහත සඳහන් පරිදි විය යුතු වේ.

1. දැනට OL වැටුප් පරිමාණයේ ප්‍රවාහන නිලධාරි තනතුරේ වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් වසර 10 සේවා කාලය සම්පූර්ණ කරන දිනට SL වැටුප් පරිමාණයේ අධීක්ෂණ මට්ටමේ ප්‍රවාහන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

2. දැනට ප්‍රවාහන නිලධාරි තනතුරේ OL වැටුප් පරිමාණයේ සේවයේ යෙදී සිටින වසර 10 ට අඩු සේවා කාලයක් ඇති සේවකයින් ඉහත අනුමත කරන ලද බඳවා ගැනීමේ සුදුසුකමක් සම්පූර්ණ කළ දින සිට හෝ ප්‍රවාහන නිලධාරි තනතුරේ වසර 10 සේවා කාලය සම්පූර්ණ කරන දිනට SL වැටුප් පරිමාණයේ අධීක්ෂණ මට්ටමේ ප්‍රවාහන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

03. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

<u>පිටපත්:</u>

01.ප්‍රධාන ලේකම් - වයඹ පළාත - කා.දැ.පි.
02.ලේකම්,සමුපකාර සංවර්ධන වෙළඳ,ඉඩම්,විදුලිබල හා බලශක්ති,ක්‍රීඩා හා යෞවන කටයුතු සංස්කෘතික,කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.පි.
03.සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් - වයඹ පළාත - දැ.පි. හා අ.ක.ස.
04.සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.පි හා අ.ක.ස.
05.සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල/හලාවත/කුලියාපිටිය -දැ.පි.හා අ.ක.ස.